www.agaram.lk

සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்
Sabaragamuwa Provincial Department of Education

**පළමු වාර පරීක්ෂණය 2018** **06 ශ්‍රේණිය**
மூன்றாம் தவணைப் பரீட்சை **2018** தரம் **06**
**FirstTerm Test 2018** **Grade 06**

**ක්‍රිස්තු ධර්මය I,II**
**கிறீஸ்தவம் I,II**

**කාලය පැය දෙකයි.**

Agaram.LK - Keep your dreams alive!

නම ...........................................................................................................................

I කොටස

**වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න**

1. මැවිල්ලේ නිර්මාතෘවරයාණන් වන්නේ
   - I. ජේසුස් වහන්සේය
   - II. දෙවියන් වහන්සේය
   - III. ආදම්ය
2. මැවිල්ල පිළිබඳ කතාව ශුද්ධ බයිබලයේ සඳහන් වන්නේ මේ අතුරින් කුමන පොතේද
   - I. මතෙව්
   - II. නික්මයාම
   - III. උත්පත්ති
3. මැවීමේදී මිනිසාට හිමිවූයේ කාගේ ස්වරූපයද
   - I. දෙවියන් වහන්සේගේ ස්වරූපය
   - II. දේව දූතයන්ගේ ස්වරූපය
   - III. ආදම්ගේ ස්වරූපය
4. දෙවියන් වහන්සේ සියලුම ආකාශ වස්තූන් මැව්වේ
   - I. ලෝකයේ ආලෝකය සඳහාය
   - II. මිනිසාගේ යහපත සඳහාය
   - III. දේව බලය පෙන්වීම සඳහාය
5. ශුද්ධ වූ බයිබලයට අනුව මැවිල්ලේ උතුම්ම ස්ථානය හිමිකර ගත්තේ
   - I. මිනිසාය
   - II. ආදම්ය
   - III. දෙවිඳුන්ය
6. ජේසුතුමා ඉපදුනු බව සේවදූතයන් මුලින්ම දැනුම් දෙනු ලැබුවේ මේ අතරින් කාටද
   - I. ශාස්ත්‍රවන්තයන්ටය
   - II. එඬේරුන්ට
   - III. හෙරොද් රජුට

Agaram.LK - Keep your dreams alive!

7. "අත උසස් තැන්හි දෙවිඳුන්ට මහිමය ද මිහිපිට ප්‍රසාදය ලත් ජනයා අතර සාමයද වේවා " මෙසේ ගායනා කළේ
   I. මරියතුමියයි
   II. ජනතාවයි
   III. දේවදූතයන්ය
8. දොළොස් හැවිරිදි ජේසුතකුමරු දෙමාපියන් සමග ජෙරුසෙලම් දේව මාලිගයට ගියේ කුමක් සඳහාද
   I. දෙමාපියන්ව පුදුම කරවීමටය
   II. පඬිවරුන් සමග තර්ක කිරීමටය
   III. පාස්කු මංගල්‍යය සැමරීමටය
9. යේසුස් වහන්සේගේ කුරුසිය උසුලාගෙන යාමට උපකාරී වූයේ
   I. කිරේනියේ සීමොන්
   II. සීමොන් පේදුරු
   III. අරියමානියේ යෝසෙප්
10. යේසුතුමාගේ කුරුසියේ හිසට ඉහලින් සටහන් කල ප්‍රකාශය වන්නේ
   I. ජුදෙව්වන්ගේ පූජක
   II. ජුදෙව්වන්ගේ රජ
   III. ජුදෙව්වන්ගේ මෙසියස්

**11 සිට 15 දක්වා හිස්තැන් පුරවන්න**

11. ජේසු බිළිඳු නැමදීමට යාමට ශ්‍රාස්ත්‍රවන්තයින්ට මගපෙන්වූයේ ..............................ය
12. ජේසු උපත සඳහා මරිය තුමියව තෝරා ගත් බව එතුමියට දැනුම් දුන්නේ .............................. දේවදූතයාය
13. මැවීමේ කාර්යයේ දී දෙවියන් වහන්සේ සත්වන දවස දිනයක් .............................. ලෙස නම් කළ සේක
14. ජේසුතුමන් උත්ථාන වීම අප සිහිකරන්නේ ..............................ඉරිදා දිනයේදීය
15. ජේසුස් වහන්සේගේ කුරුසියේ දෙපස ඇණ ගසනු ලැබුවේ .......................... දෙදෙනෙකි

**16 සිට 20 දක්වා වාක්‍ය හරි නම් √ ලකුණද වැරදි නම් X ලකුණද වරහන් තුල යොදන්න**

16. දෙවියන් වහන්සේ දින හයකින් ලෝකය මැවූ සේක ( )
17. මැවිල්ල තුල මිනිසාගේ වගකීම ප්‍රයෝජන ගැනීම පමණකි ( )
18. ජේසුස් වහන්සේව කුරුසියෙහි ඇණ ගසනු ලැබුවේ කපාල පීය නම් ස්ථානයේය ( )
19. ජේසු උපත සුවිශේෂී උපතකි ( )
20. ආරම්භයේදී දෙවියන් වහන්සේ මිනිසා මැවූ සේක ( )

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

## II කොටස

**පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු ලියන්න**

01 . කෙටි පිළිතුරු ලියන්න

I. දෙවියන් වහන්සේ මිනිසා වෙනුවෙන් මැවූ සශ්‍රීක උයන නම් කරන්න
II. දෙවියන් වහන්සේ මැවිල්ල පිළිබඳව මිනිසාට පැවරූ වගකීම කුමක්ද ?
III. ජේසු කුමරුගේ දෙමාපියන් නම් කරන්න
IV. ජේසු උපත තුල ජේසු කුමරුව හඳුනාගැනීමට දේවදූතයන් එඬෙරුන්ට දුන් ලකුණ කුමක්ද
V. "ඒලී ඒලී ලාමා සබක්තානී" මෙහි අර්ථය කුමක්ද ?

02 .

I. දෙවියන් වහන්සේ බීජ උපදවන ඇට සහිත එල දරන සියලු වර්ගවල ගස්කොළන් මවන ලද්දේ කීවෙනි දවසේදීද ?
II. ගස්වැල් වලින් ඔබ ලබන ප්‍රයෝජන 3 ක් ලියන්න
III. දෙවිඳුන් මැවූ මනහර ලෝකය දිනෙන් දින විනාශයට පත් වෙමින් පවතී එය මනහරව පවත්වා ගැනීමට ඔබට කළහැකි දේවල් 5 ක් ලියන්න

03 .

I. මැවිල්ල තුළ මිනිසාට විශේෂ ස්ථානයක් හිමිවන්නේද ?
II. එසේ වීමට හේතුව කුමක්ද ?
III. දේව දරුවෙකු ලෙස ඔබ තුළ තිබිය යුතු ගුණාංග 5 ක් ලියන්න

04.

I. ජේසු උපත සුවිශේෂී උපතක් බව සනාථ කිරීමට කරුණු 3 ක් ලියන්න
II. ශාස්ත්‍රවන්තයන් ජේසු බිළිඳුට නමස්කාර කිරීමට රැගෙන ගියේ මොනවාද ?
III. ජේසු උපත අර්ථවත්ව සැමරීමට ඔබ ක්‍රියාකරන ආකාරය විස්තර කරන්න

05.

I. පුතා අපට මෙසේ කළේ ඇයි " මෙසේ විමසුවේ කවුද කාගෙන්ද ?
II. ඊට ලැබුණු පිළිතුර කුමක්ද ?
III. මෙම සිද්ධියෙන් කිතුනු දරුවන්ට ගතහැකි ආදර්ශ මොනවාද ?

06.

I. ජේසුතුමන් අප වෙනුවෙන් කුරුසියක දිවිපිදූ බව අප නිතර සිහි කරමු උන්වහන්සේ දිවිපිදූ දවස ලෙසින් අප සිහි කරන්නේ කවදාද ?
II. ජේසුස් වහන්සේ කුරුසිය මත දිවි පිදුවේ ඇයි ?
III. ඔබගේ පාපයට සමාව ඉල්ලා යැදුමක් ලියන්න

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk